# අම්බලන්තොට ප්‍රාදේශීය සභාව

අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින දකුණු පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනගත කණිෂ්ඨ සේවයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයන්හි පහත සඳහන් තනතුරු සඳහා සුදුස්සන් තෝරා පත්කර ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය | 02 | රා.ප.චක්‍රලේඛ 03/2016 (PL-01-2016) අනුව මාසික රු. 24,250-10x250-10x270-10x300-12x330- රු.36,410/- | 8 වන ශ්‍රේණිය ( 9 වසර) සමත් ව තිබීම. |

*සේවයේ නියුක්ත කිරීම පිළිබඳ කොන්දේසි :*

1. මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත්විය යුතුය.
2. පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වන්නේ ය.
3. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග, දකුණු පළාත් සභාව විසින් හා අම්බලන්තොට ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට ඔබ බැඳී සිටිය යුතු ය.

*බඳවා ගැනීමේ කොන්දේසි :*

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
2. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වර්ෂ 05 ක අනුගාමී වසර 03 ක අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය සහතික කළ යුතු ය.
4. අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. එහෙත් දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදළ නොවේ.
5 අවශ්‍යතාවය අනුව ලිඛිත/ව්‍යුහගත/ප්‍රායෝගික හෝ සම්මුඛ පරීක්ෂණයක් හා වෘත්තීය ප්‍රවීණතා මගින් සුදුසු අය තෝරා ගැනේ.
6. දණ්ඩ නීති සංග්‍රහය යටතේ හෝ වරදකරුවෙකු කරනු ලැබුවෙකු හෝ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූවෙකු නොවිය යුතු ය.
7. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය අම්බලන්තොට ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ. දැනටමත් ආදේශක සේවයේ නියුතුව සිටීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

*අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

අයදුම්පත්‍ර පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙල කර ඉල්ලුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2017.12.11 දිනට පෙර ලේකම්, ප්‍රාදේශීය සභාව, අම්බලන්තොට යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල ඡායා පිටපත් එවිය යුතු ය.

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික;
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන් සහිත);
4. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්;
5. වෙනත් සුදුසුකම් හෝ සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය;
6. තනතුරට අදල නිපුණතා සහතිකයේ පිටපතක්.

අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරන අතර, මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

පී.ඒ. ආරියරත්න,
ලේකම්,
අම්බලන්තොට ප්‍රාදේශීය සභාව.

දිනය : 2017 නොවැම්බර් මස 09 වැනි දින.

සෞඛ්‍ය කම්කරු III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ ආදර්ශ අයදුම්පත්‍රය.

1. අයදුම්කරුගේ මුලකුරු සමග නම :————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම :————————.
3. ස්ථිර පදිංචි ලිපිනය :————————.

4. ස්ත්‍රී / පුරුෂ භාවය :——————————.
5. විවාහක / අවිවාහක බව :——————————.
6. (i) උපන් දිනය :——————————.
   (ii) 2017.10.31 වැනි දිනට වයසය :- අවුරුදු:—————— මාස :—————— දින :——————
7. ජාතික හැඳුනුම්පත් අංකය :——————————.
8. ජාතිය :——————————.
9. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද?, ලියාපදිංචිවීමෙන් ද යන වග :——————————.
10. අම්බලන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි කාලය :——————————.
11. අධ්‍යාපන සුදුසුකම් :——————————.
12. සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර :——————————.
13. වෙනත් සුදුසුකම් :——————————.
14. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී තිබේ ද ?:——————————.
    තිබේ නම් ඒ පිළිබඳ විස්තර :——————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා තිබෙන තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. ඉහත සඳහන් තොරතුරු වලින් කිසිවක් සාවද්‍ය බව ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙකු කරනු ලැබීමටත්, පත් කිරීමෙන් පසු ඒ බැව් ඔප්පු වුවහොත් කිසිඳු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මම දනිමි. මම කිසිදු උසාවියකින් සාපරාදී වරදකට වරදකරු වී නොමැති බව ද, මාගේ සුපුරුදු අත්සන තබා සහතික කරමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.